රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2000

මගේ අංකය :- ආ/III/2/3-3
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2000 සැප්තැම්බර් මස 05 වෙනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානින්.

**2000 පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම සඳහා**
**<u>අවශ්‍ය කාර්ය මණ්ඩලය.</u>**

2000 ඔක්තෝම්බර් 10 වන දින පැවැත්වෙන පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මැතිවරණ කොමාසරිස්වරයාට සහ තේරීම්භාර නිලධාරීන්ට, පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් ද ඇතුළුව සමස්ත රාජ්‍ය සේවයේම නිලධාරීන්ගේ සහාය අත්‍යාවශ්‍ය වේ. මැතිවරණ රාජකාරි සඳහා හඳුනා ගනු ලබන නිලධාරීන් පමණක් නොව සෙසු සියළුම නිලධාරීන්ද අවශ්‍යතාවයක් පැන නැගුණහොත් සේවයේ යෙදීම සඳහා සූදානමින් සිටිය යුතුය.

එහෙයින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග ගත යුතු බව රජය විසින් තීරණය කර ඇත.

(අ) 2000.10.01 සිට 2000.10.15 දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුල රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට නිවාඩු අනුමත නොකල යුතු අතර මෙම කාලය සඳහා දැනටමත් නිවාඩු අනුමත කර ඇත්නම් එම නිවාඩු අවලංගු කර ඇති සේ සැලකිය යුතුය. නිලධාරියෙකු රෝගාතුර වීම වැනි අතිශයින්ම විශේෂ වූ කරුණක් සම්බන්ධයෙන් නිවාඩු ලබා දීම පිළිබඳව අදාල අමාත්‍යාංශයේ ලේකම් හෝ පළාත් සභා ප්‍රධාන ලේකම් විසින් මැතිවරණ කොමසාරිස් වරයා සමඟ සාකච්ඡා කර තීරණයක් ගත යුතුය.

(ආ) මාස 03 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා අධ්‍යයන නිවාඩු ලබා දිවයිනෙන් බැහැර යෑමට නියමිත නිලධාරීන්ට හැර වෙනත් කිසිදු නිලධාරියෙකුට රාජකාරි හෝ පෞද්ගලික කටයුතු සඳහා ඉහත සඳහන් කාලය තුල දිවයිනෙන් බැහැර යෑමට අවසර නොදිය යුතුය. දැනටමත් එසේ නිවාඩු ලබා දී ඇත්නම් එම නිවාඩු අවලංගු කර ඇති සේ සැලකිය යුතුය.

(ඇ) ඉතාමත් විශේෂිත හේතුවක් නිසා කිසියම් නිලධාරියෙකු දිවයිනෙන් බැහැර යා යුතු වන්නේ නම් හා එය කල් දැමිය නොහැකි කරුණක් වන්නේ නම් ඒ පිළිබඳ සියළුම තොරතුරු අඩංගු වාර්තාවක් අදාල අමාත්‍යාංශ ලේකම්වරයා හෝ ප්‍රධාන ලේකම්වරයා හෝ ජනාධිපති ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

(ඈ) විදේශ දූත මණ්ඩල සමඟ නිල සාකච්ඡා පැවැත්වීම, සම්මන්ත්‍රණ, සම්මේලන හා පුහුණු වැඩ සටහන් ආදිය සංවිධානය කිරීමේදී ඉහත සඳහන් කාලය තුල නිලධාරීන් මැතිවරණ රාජකාරි සඳහා යොදවා ගැනීමට බාධාවක් නොවන අන්දමින් ඒවා සංවිධානය කිරීමට සියළුම අමාත්‍යාංශ හා පළාත් සභා විසින් කටයුතු කළ යුතු වේ.

ඉහත පරිදි කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලෙසත් එම විධිවිධාන ඔබ අමාත්‍යාංශයේ / ආයතනයේ සියළුම නිලධාරීන්ට දැන ගැනීමට සලස්වන ලෙසත් කාරුණිකව දන්වමි.

මහින්ද බන්දුසේන
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය